# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2092/55 - 2018 ඔක්තෝබර් මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/15/18/2007

**කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.06.09 දිනැති හා අංක 1709/46 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.05.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මොරටුව, මෝල්පේ, සීවලී මාවත, සමරකෝන් ඉඩම, අංක 35/12/ඒ හි පදිංචි ඩබ්. විජේරත්න මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් ගල්කිස්ස, ගාලුපාර, තැ. පෙ. 14හි පිහිටි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ඔක්තෝබර් මස 05 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

IR/15/18/2007 කාර්මික අධිකරණයේ දී ය

ඩබ්. විජේරත්න මයා,
අංක 35/12/A,
සමරකෝන් ඉඩම, සීවලී මාවත,
මෝල්පේ, මොරටුව.

නඩු අංකය : 3380/A සහ

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
තැ. පෙ. 14, ගාලු පාර,
ගල්කිස්ස.

අතර පවතින කාර්මික ආරවුල

**ප්‍රදානය**

කම්කරු හා කම්කරු සබඳතා ගරු ඇමති වන ගාමිණී ලොකුගේ මැතිතුමා 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව එකී ආරවුල



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2011.05.26 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත සඳහන් පර්ශවයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ

''ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ 12 වන ශ්‍රේණියේ ජල මනු අලුත්වැඩියාකරු තනතුරෙහි සේවය කරමින් සිටියදී ජල මනු ආවරණ කොටස් දෙකක් සොරකම් කර එම මණ්ඩල භූමියෙන් පිටතට ගෙන යාමට තැත් කළේය. යන චෝදනාව මත ඩබ්. විජේරත්න මහතාට එරෙහිව ඔහු වෙත පමුණුවනු ලැබූ දඬුවම යුක්ති සහගත ද යන්න හා යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳ වේ. ''

ඉල්ලුම්කාර සේවක පාර්ශවය මෙන්ම වගඋත්තරකාර සේවායෝජක පාර්ශවය ද සාක්ෂිකරුවන් කැඳවා ඇත. දෙපාර්ශවය තම තමන්ගේ නඩු අවසන් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්කාර සේවක පාර්ශවය A1 සිට A17 දක්වා වූ ලකුණු කරන ලද ලේඛන ද වගඋත්තරකාර සේවායෝජක පාර්ශවය R1 සිට R22 දක්වා වූ ලකුණු කරන ලද ලේඛන ද සමඟ ලිඛිත දේශණ ගොනු කර ඇත.

කාර්මික අධිකරණය හා බේරුම්කරු අධිකරණ බලය ලබා ගන්නේ විෂය භාර අමාත්‍යතුමාට යොමු කිරීමෙනි.

මෙම යොමු කිරීම අධ්‍යයනය කිරීමේදී බැලූ බැල්මට පෙනී යන්නේ ඩබ්. විජේරත්න මහතාට ලබා දී ඇති දඬුවම යුක්ති සහගතද යන්න සලකා බැලීම හා යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න වශයෙන් කොටස් 02ක් හඳුනාගත හැකි බවයි.

ඒ අනුව,

මුල් අවස්ථාවේදීම සේවක පාර්ශවය බේරුම්කරණයට සිදු කරනු ලැබූ ඇති යොමු කිරීම (Reference) වරදක් ඇති බවත්, එබැවින් බේරුම්කරණයට යොමු කිරීම (Reference) සංශෝධනය කිරීමකට හෝ නව බේරුම්කරණයකට යොමු කරන ලෙසට කරනු ලැබූ ඉල්ලීමට සේවායෝජක පාර්ශවය විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලැබූ හෙයින් දෙපාර්ශවයම ලිඛිත දේශන ගොනු කරනු ලැබූ අතර එම යොමු කිරීම මතම බේරුම්කරණය ඉදිරියට පවත්වාගෙන යෑමට නියෝගයක් 2012.08.24 දින ලබා දී ඇත.

ඊට පසුව දෙපාර්ශවය විසින්ම තම තමන්ගේ සාක්ෂි කැඳවීම සිදු කොට ඇති නමුදු මුල් අවස්ථාවේ යොමුවට (Reference) අනුව විසඳීම ඇත්තේ නීතිමය කරණය පමණක් බවත් එය ලිඛිත දේශන මගින් විසඳීමට ඉල්ලා සිටි සේවායෝජක පාර්ශවය ද සාක්ෂිකරුවන් කැඳවා ඇත. ඔවුන්ගේ මෙම බේරුම්කරණයේ මුල පටන්ම ස්ථාවරය වූයේ තීරණය කිරීමට ඇති එකම කරුණ විජේරත්න මහතාට ලබා දී ඇති දඬුවම සාධාරණ හා යුක්තිසහගත ද නැද්ද යන්න පමණක් බවයි.

වගඋත්තරකාර සේවායෝජක පාර්ශවයේ තර්කය වන මෙහිදී සලකා බැලිය යුත්තේ දුන් දඬුවම පමණක් ද යන්න ප්‍රථමයෙන් විමසුමට භාජනය කළ යුතුව ඇත.

ඉල්ලුම්කාර සේවක පාර්ශවය කාර්මික ආරවුල් පනතේ 16 වන වගන්තිය අවධානය යොමු කරමින් ඉන් ඔබ්බට කරුණු සලකා බැලිය හැකි බව දක්වයි.

සේවක පාර්ශවය තමන්ගේ 2012.07.04 දිනැති ලිඛිත දේශණයෙන් මෙන්ම මෙම නඩුව අවසානයේ 2015.08.07 වන දිනැති ව ගොනු කරනු ලැබූ ලිඛිත දේශණයෙන් ද කාර්මික ආරවුල් පනතේ 16 වන වගන්තියට අවධානය යොමු කරමින් යොමුවේ (Reference) හි සඳහන් කරුණු වලට සම්බන්ධකමක් ඇති කරුණක් පිළිබඳව බේරුම්කරණයේ දී පිළිගැනීමට හෝ සලකා ලැබීමට හැකි බවට කරුණු දක්වා ඇත.

**16 වන වගන්තිය**

''කාර්මික ආරවුලක් බේරුම් කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත හෝ බේරුම්කාර මණ්ඩලයක් වෙත (යම් කාර්මික ආරවුලක්, යම් බේරුම්කරුවකු වෙත යොමු කර ඇති අවස්ථාවකදී, ඒ බේරුම්කරු ගැන කරනු ලබන සඳහනක් ලෙස ද හෝ, එවැනි ආරවුලක් යම් බේරුම්කාර මණ්ඩලයක් වෙත යොමු කර ඇති අවස්ථාවක දී ඒ බේරුම්කාර මණ්ඩලය ගැන කරනු ලබන සඳහනක් ලෙස හෝ ''බේරුම්කරු'' යන යෙදුම, මේ පනතේ මින් මතු තේරුම් ගත යුතු ය.) යොමු කරමින් 3(1)(ඇ) වන වගන්තිය යටතේ කරනු ලබන සෑම නියෝගයක් ම හෝ, ඒ ආරවුල බේරුම්කිරීම මගින් නිරවුල් කිරීම සඳහා බේරුම්කරුවකු වෙත යොමු කරමින් 4(1) වන වගන්තිය යටතේ කරනු ලබන සෑම නියෝගයක් ම හෝ සමග, ඒ පාර්ශව අතර ඇති ආරවුලට විෂය වී ඇතැයි කොමසාරිස්වරයාගේ දැනීමේ හැටියට ඔහු විසින් සලකනු ලබන එක් එක් කරුණ සඳහන් කරමින් කොමසාරිස්වරයා විසින් පිළියෙල කළ ප්‍රකාශයක් ද යැවිය යුතු ය.

යට කී නියමය කරන ලද දිනයට පෙර, ඒ ආරවුලට සම්බන්ධ පාර්ශව අතර ඒ ආරවුලට විෂය වී තිබුණ කරුණක් බවට ඒ ආරවුල යොමු කරනු ලැබූ බේරුම්කරු සෑහීමට පත්වන පරිදි පෙන්නුම් කරන ලද්ද වූ යම් කරුණක්, කොමසාරිස්වරයා විසින් පිළියෙල කරන ලද ප්‍රකාශයෙහි සඳහන් කරුණකට සම්බන්ධකම් නැතහොත් එවැනි කරුණකින් උද්ගතවන්නේ නම් ඒ කරුණ පිළිගැනීම, සලකා බැලීම සහ ඒ පිළිබඳව තීරණයක් දීම සම්බන්ධයෙන් බේරුම්කරුවකු සතු බලතල හීන කිරීමක් මේ වගන්තියේ ඉහත දැක්වෙන විධිවිධානවල ඇතුළත් කිසිවකින් සිදු වේ යයි නොසැලකිය යුතු ය.''

එසේම කාර්මික ආරවුල් පනතේ 17 වන වගන්තියට අවධානය යොමු කිරීමේ දී බේරුම්කරණයේ ඇති පුළුල් බලතල දැකිය හැකිය.

ඒ අනුව අවශ්‍ය විමර්ශණයක් කිරීමේ පුළුල් බලතල බේරුම්කරුට පැවරී තිබේ.

17 වන වගන්තිය

(1) යම් කාර්මික ආරවුලක් නිරවුල් කිරීම සඳහා 3(1)(ඇ) වන වගන්තිය හෝ 4(1) වන වගන්තිය හෝ යටතේ බේරුම්කරුවකු වෙත යොමු කර ඇති අවස්ථාවක දී, ඒ ආරවුල සම්බන්ධයෙන් අවශ්‍යයැයි ඔහු විසින් සලකනු ලබන සියලු පරීක්ෂණ පැවැත්වීම ද, ආරවුලට සම්බන්ධ පාර්ශ්ව විසින් ඉදිරිපත් කරනු ලබන සියලු සාක්ෂි විභාගකිරීම ද, ඉන් පසු, සාධාරණ සහ යුක්ති සහගත යයි ඔහුට පෙනී යන තීරණයක් දීම ද ඔහු විසින් කළ යුතු ය. බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා කම්කරු විනිශ්චය සභාවක් වෙත යොමු කරන ලද කාර්මික ආරවුලක් නිරවුල් කිරීම සඳහා වන නීති කෘත්‍යවලට විනිශ්චය සභාව විසින් ප්‍රමුඛත්වය දිය යුතු ය.

George Kulathunga, Labour Office, Colombo South Vs S. N. Dodangoda Others (1986) 3 SLR 154 හි දී ද ප්‍රදානය ලබා දී ඇත්තේ 17 වන වගන්තිය ප්‍රකාරව විමර්ශනයක් සිදු කිරීමෙනි.

ඒ අනුව ඉල්ලුම්කරුට සේව්‍ය පක්ෂය ලබා දුන් දඬුවම මෙන්ම ඒ හා සම්බන්ධිත ඊට ආනුශංගික කරුණු ද සලකා බැලිය හැකි බව මෙම බේරුම්කරණයේ දී තීරණය කරමි.

වගඋත්තරකාර සේවායෝජක පක්ෂය ද තමන් වෙනුවෙන් සාක්ෂිකරුවන් කැඳවමින් ඉල්ලුම්කාර සේවක මහතාට එල්ලවී ඇති චෝදනාව හා ඊට අදාළ සිද්ධිය සම්බන්ධයෙන් මෙන්ම ඔහුට විරුද්ධව පැවති විනය පරීක්ෂණය සම්බන්ධයෙන් සාක්ෂි මෙහෙය වීම මගින් මෙන්ම ඊට අදාළ ලේඛන ලකුණු කිරීම මගින් මුලින් වගඋත්තරකාර සේවායෝජක පක්ෂය ලබා දුන් දඬුවම යුක්ති සහගත ද නැද්ද යන්න පමණක් සලකා බැලිය යුතුයි යනුවෙන් මතු කළ ස්ථාවරය වෙනස් කර හෝ වෙනස් වී ඇති බව පෙන්නුම් කරයි.

තවද වගඋත්තරකාර සේවායෝජක පක්ෂය එල්ල කරනු ලබන චෝදනාව ඉල්ලුම්කාර පක්ෂය ප්‍රතික්ෂේප කරයි. ඒ අනුව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂිවල සාක්ෂිමය වටිනාකම සලකා බැලීමට තීරණය කරමි.

සේවායෝජක පක්ෂය, සේවක පාර්ශවයට එල්ල කර ඇත්තේ සොරකම් කිරීම හා/හෝ සොරකම් කරගෙන එළියට යාමට තැත් කිරීම සම්බන්ධ චෝදනාවකි. දණ්ඩ නීති සංග්‍රහයේ 366 වන වගන්තියට අනුව සොරකම මෙසේ නිර්වචනය කර ඇත.

''යමෙකු යම් චංචල දේපලක් යම් තැනැත්තකුගේ ස්වාමිත්වයෙන් එකී තැනැත්තාගේ කැමැත්ත නොමැතිව වංක ලෙස ගැනීමේ අදහසින් එබඳු ගැනීම සඳහා ඉවත් කරතොත් ''සොරකම්'' කළ ලෙස සලකනු ලැබේ.

සේවායෝජක පක්ෂයේ සාක්ෂි අනුව ගබඩා කර තිබූ ජල මනු කොටස් 02ක් ගබඩා භාරකරුගේ අනුදැනුමකින් තොරව සේවක මහතා ඉවතට ගෙන යාමේ වංක චේතානාවෙන් තම ගමන් මල්ලේ සඟවා ගෙන ඉවතට ගොස් ඇත.

ඒ අනුව සොරකම සම්පූර්ණ වීමට අවශ්‍ය සියළු අංගෝපාංග එහි ඇත. ගෙට්ටුවෙන් පිටතට ගෙන යාමක්ම අවශ්‍ය වන්නේ ද ? තිබූ තැනින් ඉවත් කිරීම පමණක් ප්‍රමාණවත් වන්නේ ද ?

මේ වැනි තත්ත්වයක් යටතේ සේවායෝජක පාර්ශවය සොරකම් කිරීමේ චෝදනාවක් චෝදනා පත්‍රයට ඇතුළත් නොකොට සොරකම් කිරීමට තැත් කිරීම දක්වා චෝදනාව පහත හෙලා ඇත්තේ කුමන පදනමින් ද ? යන බරපතල ගැටළුව පැන නගී.

මෙය සිදුවූයේ සේවායෝජක පක්ෂයකට ඒ සම්බන්ධයෙන් නිසි දැනුමක් නොමැති වූ නිසාද නැතිනම් තමන්ට ඒ සමබන්ධයෙන් විශ්වාසයක් නොතිබූ නිසාද යන්න නිවැරදිව දැන ගැනීමට නොහැක.

කෙසේ වුව ද පොදු දේපල සොරකම් කරනු ලැබූ/සොරකම් කිරීමට තැත් කරනු ලැබූ සේවකයෙකු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රියාදාමය ආයතනයේ කාර්මික සාමය පවත්වා ගෙන යාමට මෙන්ම සේවකයන්ගේ විනය පාලනයට වැදගත් වේ. වගඋත්තරකාර සේවායෝජක පාර්ශවය ආයතන සංග්‍රහයට අනුව දඬුවම් ලබා දුන් බවත් යම් හෙයකින් අපරාධ අධිකරණ ක්‍රියා දමයක දී ඊට වඩා වැඩි දඬුවමක් ලැබිය හැකි බවටත් සාක්ෂි මෙහෙයවා ඇති නමුදු අපරාධ අධිකරණමය ක්‍රියාදමයකදී ඔප්පු කිරීමේ භාරය, එනම් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කළ යුතු බව අමතක කර ඇත.

අපරාධ අධිකරණමය ක්‍රියාදමයකදී සේවක මහතා නිදහස් වුවහොත් තමන්ගේ අභ්‍යන්තර විනය පරීක්ෂණයේ ප්‍රතිඵලයට බලපෑමක් ඇති විය හැකි නිසා අපරාධ අධිකරණ ක්‍රියාදාමයකට යොමු නොවූයේ ද ? නැතිනම් වෙනත් හේතුවක් නිසා දැයි පැහැදිලි නැත.

ඒ කෙසේ වුව ද බේරුම්කරණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි අනුව ද මෙම සිදු කළා යැයි කියනු ලබන සොරකම/සොරකම් කිරීම තැත් කිරීම සම්බන්ධයෙන් සැකමුසු/අවිනිශ්චිත ස්ථානයන් ගණනාවක් අනාවරණය වී ඇත.

මන්ද Herath & Company (Ceylon) Ltd Vs Kariyawasam (1968) 71 NLR 382 "Arbitrator Appointed Thereafter his duty to weigh evidence" බව හී ද දක්වා ඇත.

ඒ අනුව,

(i) අත්අඩංගුවට ගන්නා යැයි කියනු ලබන භාණ්ඩ සුරක්ෂිත කිරීමට පියවර ගෙන නැත. අඩුම තරමින් ඊට ඉල්ලුම්කරුගේ අත්සනවත් ලබා ගෙන නැත. අත්අඩංගුවට ගත් භාණ්ඩම පසුව ඉදිරිපත් වන බවට තිබෙන සහතිකය ප්‍රමාණවත් ද ?

(ii) සොරබඩු සඟවා ගෙන තිබුණේ යැයි කියන ගමන් මල්ල නැත. එය නැවත සේවකයාටම භාර දුන් බව පවසයි. එය විය හැකි ද ? මෙම සේවකයා එකී සොරකම කළ බවට තිබිය හැකි හොඳම සාක්ෂිය, එම සේවකයාගේ ගමන් මල්ල ය.

(iii) අත්අඩංගුවට ගත්තේ යැයි කියනු ලබන භාණ්ඩ ආරක්ෂක අංශ (පෞද්ගලික ආරක්ෂක සමාගමක්) විසින් මණ්ඩලයට භාර දෙන්නේ දින 02කට පසුව ය.

(iv) විනය පරීක්ෂණයේ දී ජලමනු කොටස් වල වර්ගය අයිජිටොකී වර්ගය නොවේ යැයි කීම එය බොරුවක් විය හැකි බව අඹගහ පතිරණහැලාගේ ගුණසිරි පතිරණ මහතා බේරුම්කරණය ඉදිරියේ සාක්ෂි දෙමින් පවසයි.

විනය පරීක්ෂණය අතරමගදී චෝදනා පත්‍රය සංශෝධනය කර ඇත. එය බොරුවක් විය හැකි නම් චෝදනා පත්‍රය සංශෝධනය කරනු ලැබුවේ කරුණු හරි හැටි තහවුරු කර නොගෙන ද ?

සේවකයකුට එරෙහිව පවත්වනු ලබන විනය පරීක්ෂණයකදී තිබිය යුතු වෘත්තීමය භාවය එය ද ? යන ප්‍රශ්නය පැන නගී.

මුලින් ජලමනු කොටස් අයිජිටොකි යනුවෙන් පවසා පසුව එය වෙනස් වර්ගයක් යැයි පැවසූ ඉංජිනේරු සහකාර මහින්ද සමරසිංහ මහතාට ද චෝදනා පත්‍ර ගොනු කර විනය පරීක්ෂණයක් පැවැත්වූ බව පැවසුවත් ඔහුට විරුද්ධව ලබා දුන් අවවාද කිරීමේ ලිපියක් පමණක් ඉදිරිපත් කර ඇත.

විශේෂයෙන් එහිදී නමක් වෙනස් වීම සම්බන්ධ පැහැදිලි කිරීමක් නැත. මෙම උපකරණ සමඟ සැමද කටයුතු කරන නිලධාරියාට ඒවා නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය හැකි ද ? යන්න තවත් ප්‍රශ්නයක් පැන නගී.

ඒ කෙසේ වුවද මුල් චෝදනා පත්‍රයෙන් අයිජිටොකි යන වචනය ඉවත් කර සංශෝධනය කර ඇත. සාක්ෂි මෙහෙයවා ඇත්තේ ඒවා අයිජිටොකි වර්ගය නොවේ යැයි කියමිනි. එසේ නම් එම ජල මනු කුමන වර්ගයේ ද ? එවැන්නක් සංශෝධන චෝදනා පත්‍රයට ඇතුළත් කර නැත. කිසිදු සාක්ෂියක් මෙහෙයවා නැත. වර්ගයක් නැති ජල මනු කොටස ද යන වෙනත් ප්‍රශ්නයක් පැන නගී.

(v) මෙවන් ව්‍යාකුල තත්ත්වයක් යටතේ ජල මනු කොටස් අත්අඩංගුවට ගන්නේ යැයි කියනු ලබන ආරක්ෂක අංශයෙන් නඩු භාණ්ඩ හඳුනා ගැනීමට අඩුම තරමින් සාක්ෂියට කැඳවීමට තිබුණි. එසේ සාක්ෂි කැඳවා නැත.

විනය පරීක්ෂණ වාර්තාව හෝ සටහන් ඉදිරිපත් කර නැත. එම නිසා විනය පරීක්ෂණයේ දී ආරක්ෂක අංශ සාක්ෂි දුන්නේ දැයි හෝ කුමන ආකාරයේ සාක්ෂියක් දුන්නේ දැයි දැනුවත් භාවයක් නැත.

(vi) සොරබඩු සමඟ අත්අඩංගුවට ගත් අයෙකුගෙන් සොරබඩු පමණක් ලබා ගෙන අව්ලාවේ (රාත්‍රී වැඩ අවසන් නොවන වෙලාවක කිසිදු විමර්ශනයක් නොකොට ඉහළට නොදන්වා) ගේට්ටුවෙන් එළියට යන්න දෙනවා ද ?යන ප්‍රශ්නයක් මතු වේ.

(vii) සිද්ධිය පිළිබඳ තොරතුරු සටහන් පොතේ (IB) සේවකයාගේ අත්සන ද නැත.

(viii) මාස 2 1/2 කට පසු වැඩ තහනම් කිරීම

(ix) සොරකම් කළා යැයි කියනු ලබන සේවකයාගේ ප්‍රකාශයක් සටහන් කර ගත්තේ සිද්ධිය සිදු වී දින 20කට පසුව ය. ඉතා උදාසීනව කටයුතු කිරීමක් විද්‍යමාන වේ.

(x) සිද්ධිය වූ දින ඩබ්. විජේරත්න මහතා සමඟ අනවසරයෙන් ගේට්ටුවෙන් පිට වී ගියා යැයි කියන අනෙකුත් සේවකයින් තුන් දෙනා සම්බන්ධයෙන් ගනු ලැබූ කිසිදු විනය ක්‍රියා මාර්ගයක් නැත. එයද විනය විරෝධී ක්‍රියාවකි. යම් ආකාරයේ ඉතාම බරපතල සැකමුසු තැන් ගණනාවක් සේවායෝජකගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් මතු වෙයි.

සොරකම වැනි අපරාධ අධිකරණයක දඬුවම් කළ හැකි ගණයේ ලා සැලකෙන වරදකදී අධිකරණයේ පවා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමක් බලාපොරොත්තු වන තත්ත්වයක් යටතේ වගඋත්තරකාර සේවායෝජකගේ හැසිරීම හා වගකීම ඊට ප්‍රමාණවත් වී දැයි ප්‍රශ්න කළ යුතුව ඇත.

තවද මෙහිදී විශේෂයෙන්ම සලකා බැලිය යුතු කරුණ වන්නේ විධිමත් විනය පරීක්ෂණයේ දී චූදිත මහතාට එල්ල කරනු ලැබූ ප්‍රධාන චෝදනා 4න් දෙකක් නිදහස් වීමයි. එනම් II, IV චෝදනා වලිනි. ඒවා නම්

II 2006.02.02 වන දින 22.20 පැයට හෝ ඊට ආසන්න වේලාවකදී සේවා ස්ථානයෙන් අනවසරයෙන් පිට වී 2006.02.03 දී 6.20 පැයට සේවය අවසන් කළ බවට ව්‍යාජ ලෙස වේලා සටහන් යන්ත්‍රයේ සටහන් තැබීම.

IV 2006.02.02 වන දින පැය 22.20 ට හෝ ඊට ආසන්න වේලාවක මධ්‍ය යන්ත්‍රාගාරයෙන් පිටවී ගොස් තිබියදී 2006.02.03 පැය 4 දක්වා රාජකාරියේ යෙදුන බවට සාවද්‍ය තොරතුරු ඇතුළත් අතිකාල අයදුම්පතක් ඉදිරිපත් කර අයථා ලෙස මණ්ඩලයේ මුදල් උපයා ගැනීමට උත්සාහ කිරීම.

මෙම චෝදනා මගින් ප්‍රධාන වශයෙන් දක්වා සිටින්නේ 22.30 චූදිත සේවක මහතා පිටව ගිය බවකි. ඒ චෝදනාවලින් නිදහස් (සාක්ෂි නැතිව හෝ) වීම ගතහොත් නිශ්චිත වශයෙන්ම 22.30 සේවක මහතා පිටව ගිය බව ඔප්පු වී නැත (not proved) එසේ නම් ඔහු සේවා ස්ථානයේ සිටි බව ඔප්පු වන්නේ ද (disproved)

ඒ කෙසේ වුවද මෙම චෝදනා පත්‍රයේ ප්‍රධාන චෝදනා වන්නේ I චෝදනාවයි.

I 2002.02.02 වන දින 22.20 පැයට හෝ ඊට අසන්න වේලාවකදී පෙල්වත්ත ප්‍රධාන යන්ත්‍රාගාරයේ තිබූ ජල මනු කොටස් (Meter Housing) 02ක් සොරකම් කරගෙන යෑමට තැත් කිරීම.

මෙම චෝදනාව නගා ඇති ආකාරය තරමක් ව්‍යාකූලය. බැලූ බැල්මට මෙම චෝදනාවේ චෝදනා 2ක් අඩංගු වේ.

ඒවා නම් (i) සොරකම් කිරීමයි.
(ii) සොරකම් කරන ලද භාණ්ඩ ඉවතට ගෙන යෑමට තැත් කිරීමයි.

මේ ආකාරයේ චෝදනා ගොනු කරනු ලැබුවේ නම් වඩා නිවැරදි වූත් පැහැදිලි වූත් තත්ත්වයක් ඇති වේ. විනය පරීක්ෂණයේදී 01 වන චෝදනාවට වරදකරු කිරීම මගින් මෙහි දක්වා ඇති පරිදි ඉහත කී චෝදනා දෙකට වරදකරු වන්නේ දැයි නිශ්චිත නැත. තවද සොරකම හෝ සොරබඩු ඉවතට ගෙන යෑමට තැත් කිරීම යන චෝදනාවලින් එකකට පමණක් වරදකරු වන්නේ දැයි සැක සහිත ය. තවද සොරකම නැතිනම් සොරබඩු ඉවත් කිරීමට තැත් කිරීමට වරදකරු නොවේ.

II වන චෝදනාවට නිවැරදිකරු වීම මගින් වගඋත්තරකාර මණ්ඩලයට සේවක මහතා 22.30 රාජකාරී ස්ථානයෙන් බැහැරව ගිය බව ඔප්පු කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව මෙම II චෝදනාවෙන් නිදහස් වීම මත I චෝදනාව නඟා ඇති ආකාරයෙන් සේවක මහතා I චෝදනාවට වරදකරු කළ හැකි ද යන්න ප්‍රශ්නගතය.

සේවා යෝජක පාර්ශවයම තම නඩුව පුරාම රැගෙන ගිය මෙම බේරුම්කරණයට යොමු වී ඇත්තේ ලබා දී ඇති දඬුවම යුක්ති සහගත නැද්ද යන්න තීරණය කිරීම පමණක් යන තර්කය මොහොතකට ගත්තේ වුව ද, දඬුවම සාපේක්ෂ විය යුත්තේ නගා ඇති චෝදනා වලට ය. චෝදනා ඔප්පු වී ඇති ආකාරයට ය. චෝදනා ව්‍යාකූල තත්ත්වයක් යටතේ හා වැදගත් සමහර ප්‍රධාන චෝදනා වලින් නිදහස් වී ඇති තත්ත්වයක් හමුවේ දඬුවම පමණක් සලකා බැලූවේ වුවද තත්ත්වය වෙනස් විය හැකිද ? යන ප්‍රශ්නය මතු වෙයි.

සෑම විටම සාධාරණ හා යුක්ති සහගත තීරණයක් ලබා දීමට බැඳී සිටින කාර්මික අධිකරණය හා බේරුම්කරණයේ දී ඉල්ලුම්කාර සේවක මහතාට සාධාරණය ඉටු විය යුතු බව තීරණය කරමි.

මෙකී සියලු කරුණු සලකා බැලූ කල්හි වූදිත සේවක මහතා ලබා දී ඇති චෝදනා පත්‍රය සම්බන්ධයෙන් පැවැති විනය පරීක්ෂණයේ දී වරදකරු කිරීමට ගෙන ඇති තීරණය හා එම තීරණ මත ලබා දී ඇති දඬුවම් සාධාරණ හා යුක්ති සහගත නොවන බව තීරණය කරමි.

ඒ අනුව

(අ) පහත හෙලන ලද ජලමනු අළුත්වැඩියාකරණ 1 තනතුරේ පිහිටු වන ලෙසත්, දැනටමත් එම තනතුර දරන්නේ නම් ඒ මත නියාමන උසස් වීම් ලබා දෙන ලෙසත්

(ආ) නිසි වැටුප් තලයේ පිහිටුවන ලෙසත්, වැටුප් පහත හෙලා සිටි තලයට අදාළ හිඟ වැටුප් ගෙවන ලෙසත්

(ඈ) තලයට අදාළව වැටුප් වර්ධක ලබා දෙන ලෙසත්

(ඇ) සේවය තහනම් කර සිටි තලයට අදාළ හිඟ වැටුප් ගෙවන ලෙසත්

(ඈ) (මැද කොළඹ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත යොමු කරනු ලැබූ ස්ථාන මාරු වීම අවලංගු කරන ලෙසත් නියෝග කරනු ලැබේ.

(ඉ) විනය පරීක්ෂණයේ ප්‍රතිඵල මත යම් වරප්‍රසාදයක් අහිමි කර ඇත්නම් ඒ සියළු වරප්‍රසාද නැවත ලබා දිය යුතු ලෙසටත් තීරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට සහතික කරමි. මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළවී මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු ය.

බේරුම්කරු,
සුනෙත් ලොකුබෝගහවත්ත.

2018 පෙබරවාරි මස 28 වැනි දින.

10 - 1383

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.